**ගල්ගමුව ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුළ ගොඩනැගිලි 06 ක සංවර්ධන වියදම් රු.19,122,485ක් හා 2021 වර්ෂය තුළ මිල දී ගෙන තිබූ රු.187,196ක් වටිනා උපකරණ වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය වාර්තාව සකස් කිරීමට කටයුතු කරන අවස්ථාවේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.429,613ක් වැඩියෙන් දක්වා තිබුණි. | හිඟ වරිපනම් ගිණුම වර්ෂ දෙක මාරුවීම මත මෙම සංඛ්‍යාත්මක අගය සිදු වී ඇති බව. | -එම- |

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන වල එකතුන් අතර රු.4,668,257ක වෙනසක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම**

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දක්වා ප්‍රාදේශීය සභා පනත | | | |
| | 152 වගන්තිය | වසර 5කට වඩා පැරණි හිඟ වරිපනම් බදු රු.398,984 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විටත් රතු නිවේදන නිකුත් කිරීමට කටයුතු කළ බව. | අදාළ වගන්තිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) | | | |
| i | රීති 59 | වර්ෂය ආරම්භයේදී වෙළඳ බලපත්‍ර, කර්මාන්ත හා ව්‍යාපාර බදු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර තිබුණද, එමගින් ලබාගත් තොරතුරු ආදායම් ලේඛනවල ඇතුළත් කර බිල්කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට අදාළ සමීක්ෂණ සිදු කරන සියලුම කර්මාන්ත ලේඛනයට ඇතුළත් කර බදු අය කර ගන්නා බව. | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| ii | රීති 218 | සමීක්ෂණය මණ්ඩලය මගින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි ඇතුළු ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ මේ සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | අංක 571 | රු.2,396,826 ක් වූ කල් ඉකුත් වූ ඇප තැන්පතු නියාදනය කර නොතිබුණි. | ඉතිරි තැන්පත් මුදල් සම්බන්ධයෙන් ද කමිටු තීරණ වලට යොමුකර මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,224,730 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,362,551 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායයම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය බිල් කළ ආදායමින් | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය බිල් කළ ආදායමින් |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 4,725 | 2,961 | 2,292 | 668 | 4,536 | 3,035 | 1,081 | 1,954 |
| කුලී | 22,713 | 10,628 | 9,629 | 998 | 24,205 | 21,807 | 9,986 | 11,820 |
| බලපත්‍ර ගාස්තු | 2,120 | 2,141 | 2,141 | - | 1,987 | 3,035 | 3,035 | - |
| වෙනත් ආදායම් | 21,958 | 27,153 | 19,076 | 8,077 | 19,053 | 23,192 | 28,192 | - |
| | 51,516 | 42,883 | 33,138 | 9,743 | 49,781 | 51,069 | 42,294 | 13,774 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල 16 ක් බදු දීම වෙනුවෙන් රු.1,954,112 ක හිඟ බදු මුදලක් ලැබිය යුතුව පැවතුණි. | 2022 දෙසැම්බර් 31 දිනට පැවති බදු කුලී හිඟ මුදලින් දේපල 07ක් නඩු සඳහා යොමු කර ඇති බව. | හිඟ කඩකුලී හා දඩ මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | **වෙනත් ආදායම්**<br>සමාලෝචිත වර්ෂය සඳහා සේවා සඳහා ගාස්තු රු.6,051,405ක් ද , දඩ හා වරෙන්තු ගාස්තු රු.7,537,932 ක් ද වෙනත් ආදායම් රු.1,184,945ක් ද අයවිය යුතුව පැවතුණි. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ වසර 02 සිට 05 දක්වා කාලයට අදාල ලැබිය යුතු ගිණුම් 03 ක ශේෂ එකතුව රු.92,106,915 ක් වූ අතර වසර 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් එකතුව රු.4,744,009 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වසර 02 සිට 05 දක්වා කාලයට අදාල ගිණුම් ශේෂ එකතුව රු.101,327,793 ක් වූ අතර වසර 05ට වැඩි ශේෂය එකතුව රු.10,003,534 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | සභාව සතුව පැවති ඉඩම් හා ගොඩනැගිලි 20ක් හා පෙර පාසලට පරිත්‍යාග ලෙස ලැබී තිබූ උපකරණ 05ක වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.\ | පරීක්ෂා කර බලා ලේඛනගත කිරීමෙන් පසු මූල්‍ය වාර්තාවට ඇතුළත් කරන බව. | වත්කම්වල වටිනාකම නිවැරදිව තක්සේරු කර නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරන වෑන් රථය හා ජීප් රථය ද ඉඩම් 15ක් සහ ක්‍රීඩාපිටි 04ක් ද, පෙර පාසල් 46 ක් හා සුසාන භූමි 117 ක් ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | වෑන් රථය හා ජීප් රථයේ හිමිකාරිත්වය සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආදායම් ශීර්ෂ 05ක ඇස්තමේන්තුගත සහ සත්‍ය ආදායම් අතර සියයට 34 සිට 158 දක්වා විචලනයක් ද වැය විෂයයන් 18ක සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30කට වඩා ප්‍රතිපාදන වැය නොවී විචලතාවයක් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | 2024 අයවැය සකස් කිරීමේදී පෙන්වාදී ඇති විචලතාවයන් මගහරවා ගනිමින් අයවැය සකස් කිරීමට කටයුතු කරන බව. | තාත්විකව අයවැය පිළියෙල කිරීමට හා එය මත පදනම්ව ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |